වාර්ෂික කාර්යසාධන වාර්තාව

வருடாந்த செயலாற்றுகை அறிக்கை

Annual Performance Report

2021



ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

கிராமிய வயல்கள் மற்றும் அண்மித்த குளங்கள், நீர்ப்பாசன அபிவிருத்தி இராஜாங்க அமைச்சு

State Ministry of Tanks, Reservoirs and Irrigation Development Related to Rural Paddy Fields

2021 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

ආයතනයේ නම - .ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

වැය ශීර්ෂ අංකය. 429

අන්තර්ගතය

	පිටුව
පරිච්ඡේදය 01- ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය	01
පරිච්ඡේදය 02- ප්‍රගතිය හා ඉදිරි දැක්ම	05
පරිච්ඡේදය 03- වසරේ සමස්ත මූල්‍ය කාර්යය සාධනය	10
පරිච්ඡේදය 04- කාර්යය සාධන දර්ශක	23
පරිච්ඡේදය 05- තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය	24
පරිච්ඡේදය 06- මානව සම්පත් පැතිකඩ	27
පරිච්ඡේදය 07- අනුකූලතා වාර්තාව	29

පරිච්ඡේදය 01- ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

2020 වර්ෂයේ අගෝස්තු මාසයේදී පිහිටුවන ලද මෙම රාජ්‍ය අමාත්‍යාංශය වෙත මූලික ව පැවරී ඇති කාර්යභාරය වාරි සෞභාග්‍යා වැඩසටහන යටතේ දිවයිනෙහි සුළු වාරිමාර්ග වැව්/අමුණු/ඇල මාර්ග 5000 ක් පුනරුත්ථාපනය/ අළුත්වැඩියා කිරීම/නවීකරණය කිරීම ඔස්සේ සංවර්ධනය කිරීම වේ.

ඒ අනුව 2020 වර්ෂයේදී සැලසුම් කළ පරිදි 2021 අයවැය ඇස්තමේන්තුව මඟින් අනුමත කරන ලද රු. මිලියන 3000 ක ප්‍රතිපාදන මඟින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව, පලාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව,ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව , මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි අධීක්ෂණය මත ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාව ද මොණරාගල හා බදුල්ල දිස්ත්‍රික්කයන් හි තෝරා ගත් වැව් ද ලෙස මුළු දිවයින ම ආවරණය වන පරිදි වැව්/අමුණු/ඇල මාර්ග පුනරුත්ථාපනය/ අළුත්වැඩියා කිරීම/නවීකරණය සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

එමෙන්ම මෙම රාජ්‍ය අමාත්‍යාංශය පිහිටුවීමේ දී පවරන ලද ප්‍රමුඛතා කාර්යයන් හා රජයේ ප්‍රමුඛ අවශ්‍යතා අනුව වාරි සෞභාග්‍යා වැඩසටහන යටතේ සුළු වාරිමාර්ගවලට අදාල වාරි රක්ෂිතයන් මැණුම් කටයුතු කර නිරවුල් කිරීම,සුළු වාරිමාර්ග වැව් වල ජල හා භූමි ඵලදායීතාවය වැඩි කිරීම, සංචාරක ව්‍යාපාරයේ ප්‍රවර්ධනය සඳහා වැවෙහි දායකත්වය ලබා දීම අරමුණු කරගනිමින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා මූලික කටයුතු රැසක් 2021 වර්ෂයේ දී ආරම්භ කරන ලදී.

ග්‍රාමීය වාරි පද්ධති පිළිබඳ භූගෝලීය තොරතුරු පද්ධතියක් ස්ථාපනය කර වාරි සෞභාග්‍යා වැඩ සටහනේ ප්‍රගතිය අධීක්ෂණය පහසු කිරීම සඳහා යෙදවුමක් සකස් කිරීම මෙන් ම සුළු වාරිමාර්ග වැව්/අමුණු/ඇලමාර්ග පුනරුත්ථාපනය පිළිබඳ ඩිජිටල් හා ජනමාධ්‍ය ආශ්‍රිත ව පොදු මහජනතාව දැනුවත් කිරීම මෙන්ම අධ්‍යාපනික දැනුම වර්ධනය කිරීම සඳහා ද 2021 වර්ෂයේ දී අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදන වැය කරන ලදී.

2021 වර්ෂයේ මෙම රාජ්‍ය අමාත්‍යාංශය සඳහා අයවැය ඇස්තමේන්තුව මඟින් අනුමත ප්‍රතිපාදන වලට අමතරව වාරිමාර්ග දෙපාර්තමේන්තු හා මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ වැයශීර්ෂ යටතේ ද අමතර ප්‍රතිපාදනයක් මෙම රාජ්‍ය අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන ලද වාරි සෞභාග්‍යා වැඩසටහන යටතේ වැව් සංවර්ධන ව්‍යාපෘතිය මූල්‍යයනය කිරීම සඳහා වර්ෂය අවසානයේදී ලබා දෙන ලදී.

1.2 ආයතනයේ

i. දැක්ම

වැඩිවර්ධනය කල හැකි ජල ගබඩා ධාරිතාවයක් හා වැඩිදියුණු කළ ජල ඵලදායිතාවයක් ඔස්සේ සශ්‍රීක ග්‍රාමීය ආර්ථිකයක්

ii. මෙහෙවර

ග්‍රාමීය වාරි පද්ධතිය පුනරුත්ථාපනය,අළුත්වැඩියා කිරීම හා නවීකරණය හා එම යටිතල පහසුකම් සඳහා තිරසර කළමණාකරන ප්‍රවේශයක් හඳුන්වා දීම මගින් රටෙහි කෘෂි නිෂ්පාදනය වැඩි කිරීම හා වෙනත් පාරිසරික හා ගෘහස්ථ අවශ්‍යතා සඳහා ජල මූලාශ්‍ර සංවර්ධනය කිරීම.

iii. අරමුණු

- ග්‍රාමීය වාරි පද්ධති ක්‍රමානුකූලව පුනරුත්ථාපනය කිරීම හා නිසි නඩත්තු යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම මඟින් වාරි ජල සැපයුම ස්ථායී කිරීම.

- ග්‍රාමීය වාරි පද්ධති වල රක්ෂිත මැන තහවුරු කිරීම හා වන රෝපනය කිරීම මඟින් ඒවායේ දිගුකාලීන ආරක්ෂාව හා පැවැත්ම තහවුරු කිරීම.

- ග්‍රාමීය වාරි පද්ධති කළමණාකරන ආයතනික රටාව ක්‍රමවත් කිරීම මඟින් මහජන ගැටළු විසඳීමේ යාන්ත්‍රණය සරල කිරීම .

- වැව්/ අමුණු ආශ්‍රිත ගොවි සංවිධාන කේන්ද්‍ර කර ගනිමින් පිහිටුවන වැව් කමිටු මඟින් ඒවායේ ආර්ථික ඵලදායිතාව වැඩිදියුණු කිරීම සඳහා සුදුසු යෝජනා හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම.

- ග්‍රාමීය කුඩා වාරි පද්ධති සඳහා බහුවාර්ෂික භෝග සංවර්ධනය,මිරිදිය ධීවර,සංචාරක, විදුලි උත්පාදන හා සත්ව පාලන වැනි විකල්ප විභවයන් හඳුනා ගනිමින් එම පද්ධති ග්‍රාමීය බහු ආර්ථික කේන්ද්‍රස්ථාන වශයෙන් වැඩි දියුණු කර තිරසර ලෙස පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය ක්‍රම හා විධි සම්පාදනය කිරීම.

1.3 ප්‍රධාන කාර්යයන්

- ග්‍රාමීය වැව්, ජලාශ හා වාරි නිර්මිත නවීකරණය/ ප්‍රතිසංස්කරණය සඳහා කඩිනම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ගංගාධාර ,ගංගා ද්‍රෝණි හා වැව් තාවිළු සංරක්ෂණය සඳහා නෛතික බලගැන්වීම් සවිමත් කිරීම හා ප්‍රජා පාදක වැඩසටහන් හා රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- අභ්‍යන්තර ජල ප්‍රභවයන් හි ආක්‍රමණකාරී ජලජ ශාක තුරන් කර මනා ලෙස පවත්වා ගෙන යාම සඳහා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම
- වාරි ජල සැපයුම් හි ඒකක ජල ඵලදායීතාවය වැඩි කිරීම සඳහා වාරි තාක්ෂණයන් ලෙස උස්සාන, විසිරි වාරිමාර්ග ((Lift and Sprinkler irrigation) භාවිතා කිරීම කෙරෙහි ගොවි ජනතාව නැඹුරු කරවීම සඳහා නියමු ව්‍යාපෘති සම්පාදනය කිරීම හා ගොවි සංවිධාන දැනුවත් කිරීම ඔස්සේ ගොවීන් ඒ සඳහා යොමු කිරීම
- හදුනාගත් වැව්/වැව් පද්ධති වල ධාරිතාවය වැඩි කිරීම සඳහා රොන්මඩ ඉවත්කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- කාර්යක්ෂම ලෙස ජලය බෙදා හැරීම හා කළමණාකරනය සඳහා ග්‍රාමීය කුඹුරු ආශ්‍රිත ව ඇති ඇල මාර්ග පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම
- ග්‍රාමීය වැව් මට්ටමින් ගොවි සංවිධාන හා ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම

Organization Chart

State Ministry of Tanks, Reservoir and Irrigation Development Related to Rural Paddy Fields



1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු / දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ /දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශිය ලේකම් කාර්යාල

මෙම රාජ්‍ය අමාත්‍යාංශය යටතේ සෘජුව ම දෙපාර්තමේන්තු නොමැති අතර වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය වෙමින් එම ආයතනයන්හි අදාල අංශ සමඟ ඒකාබද්ධ ක්‍රමවේදයක් යටතේ කටයුතු කෙරේ.

1.6 අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/පළාත් සභාව යටතේ පවතින ආයතන/අරමුදල්

නොමැත

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්) - නොමැත

අ) ව්‍යාපෘතියේ නම

ආ) දායක නියෝජිතායතනය

ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වියදම - රු .මි.

ඈ) ව්‍යාපෘති කාල සීමාව

පරිච්ඡේදය 02- ප්‍රගතිය හා ඉදිරි දැක්ම

වාරි සෞභාග්‍ය වැඩසටහන යටතේ වැව් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

2021-2023 මධ්‍යකාලීන අයවැය රාමුව තුල වැව් /අමුණු හා ආශ්‍රිත ඇල මාර්ග 5000 ක් ක්‍රියාත්මක කර නිම කිරීමට අපේක්ෂිතය.

2021 අයවැය ඇස්තමේන්තුව මඟින් මෙම රාජ්‍ය අමාත්‍යාංශය සඳහා අනුමත කරන ලද රු. මිලියන 3000 ක ප්‍රතිපාදන මඟින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, පලාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව , දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මහනුවර හා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව මඟින් 2021 වර්ෂයේදී දිවයිනේ සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන සේ සුළු කර්මාන්ත පුනරුත්ථාපනය/අළුත්වැඩියා කිරීම/ නවීකරණය කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව දිස්ත්‍රික්ක 25 හි ම වැව් / අමුණු 1400 කට අධික සුළු වාරිකර්මාන්ත සංඛ්‍යාවක පුනරුත්ථාපන කටයුතු ක්‍රියාත්මක කළ අතර,2021 වර්ෂය අවසානය වන විට එම වැව්/අමුණු 884 ක වැඩ නිම කර ඇත.වැව්/අමුණු 234ක් 75% ට වඩා වැඩි ප්‍රගතියක් ද වැව්/අමුණු 97 ක් 50% -70% ක ප්‍රගතියක් ද අත් කර ගෙන ඇත.

වාරි සෞභාග්‍ය වැඩසටහන යටතේ වැව් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරන ලද වෙනත් ප්‍රමුඛතා කාර්යයන්

- එල්ලංගා පද්ධතියක් ලෙස සංවර්ධනය කිරීමට අපේක්ෂිත මහකිරින්දේගම එල්ලංගා පද්ධතිය ආශ්‍රිත වැව් 05 ක පුනරුත්ථාපනයන් ද වාරි සෞභාග්‍ය වැව්/අමුණු සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ම ක්‍රියාත්මක කරන ලදී.

- අනුරාධපුර දිස්ත්‍රික්කයේ තෝරාගත් වැව් සඳහා මිරිදිය මත්ස්‍ය වගාව හඳුන්වා දීම හා පරිසර පද්ධති සංවර්ධනය මඟින් එම වැව් වල ජල ඵලදායීතාවය හා භූමි ඵලදායීතාවය වැඩි කිරීම - මේ යටතේ 2021 වරෂයේදී වැව් 150 ක් සඳහා මිරිදිය මත්ස්‍ය වගාව හඳුන්වා දීමට කටයුතු කර ඇත. අක් මුදල් ලැබීම මත වැය කර ඇති මුදල රු. මිලියන 0.541 කි.

- තවද මුළු දිවයිනම ආවරණය වන පරිදි පුනරුත්ථාපනය කරන ලද තෝරා ගත් වැව් වල මැණුම් කටයුතු සිදු කර නිරවුල් කිරීම සඳහා ද 2021 වර්ෂයේ දී අවශ්‍ය මූලික කටයුතු සම්පාදනය කරන ලදී.

  යාපනය විශ්වවිද්‍යාලයේ කෘෂි පීඨයේ ජල ගැටළු සඳහා විසඳුමක් ලෙස පුළුක්කුලම වැව සංවර්ධනය කිරීම හා ජල කලමනාකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ද 2021 වර්ෂයේ දී අවශ්‍ය මූලික කටයුතු සිදු කරන ලදී.

- ග්‍රාමීය වාරි පද්ධති පිළිබඳ භූගෝලීය තොරතුරු පද්ධතියක් ස්ථාපනය කර වාරි සෞභාග්‍ය වැඩ සටහනේ ප්‍රගතිය අධීක්ෂණය පහසු කිරීම සඳහා යෙදවුමක් සකස් කිරීම සඳහා 2021 වර්ෂයේ දී අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදන වැය කරන ලදී.

- වාරි සෞභාග්‍ය වැඩසටහන යටතේ සුළු වාරිමාර්ග වැව්/අමුණු/ඇලමාර්ග පුනරුත්ථාපනය පිළිබඳ පොදු මහජනතාව දැනුවත් කිරීම මෙන්ම අධ්‍යාපනික දැනුම වර්ධනය කිරීම (ඩිජිටල් හා ජනමාධ්‍ය ආශ්‍රිත ව) ද 2021 මෙම රාජ්‍ය අමාත්‍යාංශ අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදන යටතේ කටයුතු කරන ලදී.මේ සඳහා අක් මුදල් ලැබීම මත වැය කළ මුදල රු. මිලියන 0.323 කි.

- සුළු වාරිමාර්ග වැව් තාවුළු පවිත්‍ර කිරීම හා රොන්මඩ ඉවත් කිරීම මඟින් මඟින් රැඳවුම් ධාරිතාවය වැඩි කිරීම සඳහා 2021 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද නියමු ව්‍යාපෘතිය සඳහා තෝරාගත් වැව් 51 ක මිණුම් හා විමර්ශන කටයුතු මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය මඟින් ඉටු කර ගන්නා ලදී. ඒ සඳහා වැය කළ මුදල රු. මිලියන 8.329 කි.

2021 වර්ෂයේ වාරි සෞභාග්‍ය වැව් සංවර්ධන වැඩසටහන සඳහා අයවැය ඇස්තමේන්තු මඟින් ලබා දී තිබූ රු. මිලියන 3000 ක ප්‍රතිපාදනය ප්‍රමාණවත් නොවීම නිසා වර්ෂය අවසානයේ දී වාරිමාර්ග දෙපාර්තමේන්තු වැය ශීර්ෂ 282 මඟින් රු. මිලියන 556.29 ක් හා මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ වැය ශීර්ෂ 428 මඟින් රු. මිලියන 654 ක අමතර ප්‍රතිපාදන ප්‍රමාණයක් ක්‍රියාත්මක කරන ලද වැව් පුනරුත්ථාපන වැඩ මූල්‍යනය කිරීම සඳහා ලබා දෙන ලදී.මෙම රාජ්‍ය අමාත්‍යාංශ වැය ශීර්ෂ 429 හි අක් මුදල් ලැබීම අනුව රු. මිලියන 2568.196 ක් වැය කර ඇති අතර, අමතර ව ලැබුණු රු .මිලියන 1210.29 හි අක් මුදල් ලැබුණු ප්‍රමාණය අනුව වියදම රු මිලියන 715.769 කි. 2021-2023 දක්වා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති මෙම වැඩසටහන අතැති බිල්පත් වටිනාකම ද සහිතව ගත් කළ 100 % ක මූල්‍ය හා භෞතික ප්‍රගතියක් ද 2021 වර්ෂයේදී අත් කර ගෙන ඇත.

විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

විශේෂ ජයග්‍රහණ

2020 වර්ෂය අගභාගයේදී ඉතා කෙටි කාලයක් තුල මූලික සැලසුම් කටයුතු සිදු කරන ලද වාරි සෞභාග්‍ය ග්‍රාමීය වැව් සංවර්ධනය කිරීමේ වැඩසටහන මඟින් 2021-2023 මධ්‍යකාලීන අයවැය රාමුව තුල මුළු දිවයින ම ආවරණය වන පරිදි වැව්/අමුණු /ආශ්‍රිත ඇල මාර්ග 5000 ක් පුනරුත්ථාපනය/ ප්‍රතිසංස්කරණය/නවීකරණය අරමුණු කරන ලදී. ඒ අනුව 2021 වර්ෂයේදී මෙම රාජ්‍ය අමාත්‍යාංශය සඳහා අයවැය ඇස්තමේන්තු මඟින් අනුමත වූ රු මිලියන 3000 ක ප්‍රතිපාදනය මඟින් එම වැව්/අමුණු /ඇල මාර්ග 1000 ක ඉලක්කයක් සපුරා ලීමට අපේක්ෂා කරන ලදී. එසේ වුව ද එම ඉලක්කය ද ඉක්මවමින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, පලාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව , දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මහනුවර හා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් වැඩ අයිතම 1400 ක පමණ සංඛ්‍යාවක් ක්‍රියාත්මක කිරීමට මෙම රාජ්‍ය අමාත්‍යාංශයට හැකියාව ලැබුණු අතර, එම වැඩ අයිතම 800 කට අධික ප්‍රමාණයක 100 % ක භෞතික ප්‍රගතියක් වසර අවසානයේදී සපුරා ගත හැකි වීම අප ලත් ජයග්‍රහණයකි.වර්ෂය මුලදීම සැලසුම් කළ පරිදි ම අක් මුදල් ලබා ගත හැකි වූයේ නම් හා තවදුරටත් මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කළ පරිදි වර්ෂය මුලදීම ප්‍රතිපාදන ලබා ගත හැකි වූයේ නම් මෙම වැව් 1000 ක වැඩ නිම කර ගත හැකිවන බව සඳහන් කළ යුතුය. එසේ වුව ද මෙම රාජ්‍ය අමාත්‍යාංශය සඳහා 2021 අයවැය ඇස්තමේන්තු මඟින් අනුමත සීමිත ප්‍රතිපාදන ප්‍රමාණය ව්‍යාපෘති මූල්‍යනය සඳහා ප්‍රමාණවත් නොවීම නිසා වසර අවසානයේදී මහා භාණ්ඩාගාරය මඟින් වාරිමාර්ග දෙපාර්තමේන්තු හා මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ වැය ශීර්ෂ යටතේ අමතර ප්‍රතිපාදනයක් මේ සඳහා ලබා ගැනීමට සමත් වීම ජයග්‍රහණයකි.

රාජ්‍ය අමාත්‍යාංශය සඳහා අනුමත කාර්ය මණ්ඩල පුරප්පාඩු 40 % ක් ම සපුරා නොමැති හා අවම සංචිත වාහන හෝ ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැති වාතාවරණයක් තුල වාරි සෞභාග්‍ය වැව් සංවර්ධන ව්‍යාපෘතිය ඉහළ ප්‍රගතියක් කරා මෙහෙයවීමට රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුළු එම කාර්යමණ්ඩලය ට හැකිවීම ද ලැබූ ජයග්‍රහණයක් බව කිව යුතුය.

එමෙන් ම දීර්ඝ කාලයක් තිස්සේ විශාල ලෙස පරිහානියට හා නවීකරණය කිරීමේ දැඩි අවශ්‍යතා සහිතව පැවති ජාවත්ත පිහිටි රාජ්‍ය අමාත්‍යාංශ පරිශ්‍රය අළුත්වැඩියා කිරීම සඳහා රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්තුමාගේ මහඟු ප්‍රයත්නය මත හා රාජ්‍ය අමාත්‍යාංශයේ තාක්ෂණික අංශයේ නොමඳ කැප වීම මත හැකියාව ලැබිණි. ජාවත්ත පරිශ්‍රයේ පිහිටි මෙම රාජ්‍ය අමාත්‍යාංශ මෙන්ම වාරිමාර්ග අමාත්‍යාංශයේ ද අංශයන් සඳහා ද මහත් අඩුපාඩුවක් ව පැවති රැස්වීම් ශාලාව video conferencing පහසුකම ද සහිතව වැඩිදියුණු කර ගැනීමට ද මෙමඟින් අවකාශය සැලසිනි.

අභියෝග

- 2021 වර්ෂය ආරම්භයේ පටන් COVID 19 බහුල ලෙස ව්‍යාප්ත වීම හා වරින් වර බොහෝ ප්‍රදේශයන් වසා දැමීමට ලක් වීම මෙන්ම ව්‍යාපෘති කොන්ත්‍රාත්කරුවන් මෙන් ම නිලධාරීන් ද රෝගයට ගොදුරු වීම නිසා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා බාධා මතු වීම මෙන් ම තෝරාගත් ව්‍යාපෘති සඳහා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු අනුමැතිය ලබා ගැනීමේ ප්‍රමාදයන් සිදු වීම.

- දිවයින ම ආවරණය වන පරිදි ඒ ඒ දිස්ත්‍රික්කයන්හි එක් වර විශාල වැඩ අයිතම සංඛ්‍යාවක් ආරම්භ කිරීම නිසා රජය සතු යන්ත්‍ර සූත්‍ර සපයා ගැනීමේ අපහසුතා මතු වීම හා පෞද්ගලික අංශයෙන් ද එම යන්ත්‍ර සූත්‍ර අවශ්‍යතා සපුරා ගැනීම අසීරු වීම .

- අවශ්‍යතාවය අනුව අක්මුදල් ලබා ගත නොහැකි වීම.

- ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඉවත් කරන පස් හා අනෙකුත් ද්‍රව්‍ය ප්‍රවාහනයේ දී අනුමැතිය ලබා ගැනීමේ දී දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදු වීම .

- රාජ්‍ය අමාත්‍යාංශය සඳහා වාහන පහසුකම් ප්‍රමාණවත් නොවීම නිසා ක්ෂේත්‍ර අධීක්ෂණ කටයුතු සඳහා බාධා මතු වීම.

- රාජ්‍ය අමාත්‍යාංශයට අනුමත කාර්ය මණ්ඩල පුරප්පාඩු සපුරා ගැනීමට නොහැකි වීම හා රාජ්‍ය අමාත්‍යාංශය සඳහා අවශ්‍ය අවම ඉඩ පහසුකම් හෝ සපුරා ගැනීම සඳහා වසර පුරාම අවධානය යොමු කිරීමට සිදු වීම.

ඉදිරි ඉලක්ක

- ග්‍රාමීය වැව්/අමුණු 5000ක් පිළිසකර කිරීම සපුරා ගැනීම.
- වැව් ආශ්‍රිත ප්‍රජාවගේ ආර්ථික මට්ටම ඉහළ නැංවීම සඳහා ඒම වැව් ආශ්‍රිත ව ආර්ථික බෝග වගා කිරීම කෙරෙහි ගොවින් යොමු කිරීම.
- වැව් ආශ්‍රිතව මිරිදිය මත්ස්‍ය කර්මාන්තය ප්‍රවලිත කිරීම.
- සංචාරක ආකර්ශනය ප්‍රවර්ධනය වන ආකාරයට වැව ආශ්‍රිත පරිසර පද්ධතිය වැඩිදියුණු කිරීම.
- පිරිසිදු පානිය ජලය සඳහා අවකාශය ලබා දීම.
- වැවෙහි තිරසර භාවය ඇති කර ගැනීම සඳහා ක්‍රමවත් නඩත්තු යාන්ත්‍රණයක් සකස් කර ඒ සඳහා ගොවින් දායක කර ගැනීම

.....

අතිරේක ලේකම් (වාරි. සං. හා ජල සම්පත් කළ.)

ආචාර්ය ඉංජි. කිත්සිරි වැලිගෙපොලගේ
අතිරේක ලේකම්
(වාරිමාර්ග සංවර්ධන හා ජල සම්පත් කළමනාකරණ)
ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා
වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
අංක. 11, ජාවත්ත පාර, කොළඹ 05.

.....

ප්‍රගනි/ගනි/ආයතන ප්‍රධානියා

කේ.පී. විජේසිරි
ලේකම්
ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා
වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
අංක 11, ජාවත්ත පාර,
කොළඹ 05

03 පරිච්ඡේදය - 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එන්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2021 රු.		සටහන	තත්‍ය 2021 රු.	නැවත ගලපන ලද 2020 රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		**-**	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		463,011,000	10,400,000	ඒසීඒ-3
-	තැන්පතු		416,775	2,700	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම් වෙනත් ප්‍රධාන		2,153,310	207,574	ඒසීඒ-5
	ලෙජර් ගිණුම් ලැබීම්			-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**465,581,085**	**10,610,274**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**465,581,085**	**10,610,274**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		-	1,755,394	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**465,581,085**	**8,854,880**	
	අඩු කළා : වියදම්				
	පුනරාවර්තන වියදම්				

57,478,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	45,538,141	8,817,756	**ඒසිඒ-2(ii)**
37,472,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	30,538,429	6,381,002	
800,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	110,366	4,840	
-	පොළී ගෙවීම්	**8**	-	-	
250,000	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	42,230	-	
96,000,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**76,229,166**	**15,203,598**	
	මූලධන වියදම්				
8,100,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	7,272,375	100,000	**ඒසිඒ-2(ii)**
8,900,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	5,450,823	1,022,574	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	-	-	
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
1,000,000	හැකියා වර්ධනය	**14**	84,300	-	
3,000,000,000	වෙනත් මූලධන වියදම්	**15**	2,568,196,192	59,933,248	
3,018,000,000.00	**මුළු මූලධන වියදම් (උ)**		**2,581,003,690**	**61,055,822**	
	තැන්පතු ගෙවීම්		30,069	2,700	**ඒසිඒ-4**
	අත්තිකාරම් ගෙවීම්		2,583,326	4,797,030	**ඒසිඒ-5**
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**2,613,395**	**4,799,730**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		2,659,846,251	81,059,150	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		**(2,194,265,166)**	(72,204,270)	
	අග්‍රම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(2,194,265,166)	(72,204,270)	**ඒසිඒ-7**
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	**ඒසිඒ-3**
			(2,194,265,166)	**(72,204,270)**	

3.3 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පි

2021 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තක්‍ය 2021 රු.	2020 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	44,844,121	-
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	5,019,472	4,589,456
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**49,863,593**	**4,589,456**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		49,474,187	4,586,756
දේපළ පිරියත හා උපකරණ සංචිතය		-	-
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)		
ජංගම වගකීම්			
කැන්පතු ගිණුම්	ඒසිඒ-4	389,406	2,700
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		**49,863,593**	**4,589,456.0**

පිටු අංක **07** සිට **40** දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක **41** සිට **89** දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය : 25/02/2022	දිනය : 2022/02/25	දිනය : 2022-02-24.
ඉංජි. කේ. ඩබ්. අසිරිවන් ද සිල්වා ලේකම් වාරිමාර්ග අමාත්‍යාංශය අංක. 500, ටී. බී. ජයා මාවත කොළඹ 10.	කේ.ජී. විජේසිරි 2 ලේකම් ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය අංක. 11, ජාවත්ත පාර, කොළඹ 05.	M. K. D. Shiromini Chief Accountant State Ministry of Tanks, Reservoirs and Irrigation Development of Rural Paddy Fields No. 11, Jawatta Road, Colombo 05.

3.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසිඒ-සී

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය	
	2021 රු.	නැවත ගලපන ලද **2020** රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		-
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	1,916,884	191,184
අග්‍රිම ලැබීම්	463,011,000	10,400,000
අත්තිකාරම් අයකර ගැනීම්	1,982,226	4,945,176
තැන්පතු ලැබීම්	416,775	2,700
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**467,326,885**	**15,539,060**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	82,970,294	8,181,223
සහනාධාර සහ මාරුකිරීම්	110,366	4,840
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	413,165	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	1,755,394
අත්තිකාරම් ගෙවීම්	2,402,326	4,797,030
තැන්පතු ගෙවීම්	30,069	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**85,926,220**	**14,738,487**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**381,400,665**	**800,573**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		

පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	**-**	**-**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	381,400,665	800,573
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**381,400,665**	**800,573**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(381,400,665)**	**(800,573)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**-**	**-**
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	**-**	**-**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**-**

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තා කිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනා ගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනා ගැනීම හා මැණිම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2021 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය

(මු.රෙ. 106 හා මු.රෙ. 113 යටතේ වන පාඩු)

සටහන -(i)

වියදම් ශීර්ෂ අංකය: 429.00
මය :01-මෙහෙයුම් වැඩසටහන

අමාත්‍යාංශයේ නම:ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව් ,ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

(i) වර්ෂය තුළ අලාභ අයකර ගැනීම/කපාහැරීම/අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය

අගය			සිද්ධි සංඛ්‍යාව	මුළු එකතුව (රු)
රු	25,000.00	අඩු	0	0
රු	25,000.01	වැඩි	1	689,200
	එකතුව		1	689,200

අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය	සිද්ධි සංඛ්‍යාව	අගය (රු)
1.KV -1788 දරණ රථය අනතුරට ලක්වීම 2020.10.09	1	689,200
එකතුව	1.00	689,200.00

(ii) කවදූරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශය

අගය			සිද්ධි සංඛ්‍යාව	මුළු එකතුව (රු)
රු	25,000.00	අඩු		
රු	25,000.01	වැඩි	1	1,112,875.00
	එකතුව		1	1,112,875.00

අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය	සිද්ධි සංඛ්‍යාව	අගය (රු)
1.KV -1788 දරණ රථය අනතුරට ලක්වීම	1.00	1,112,875.00
එකතුව	1.00	1,112,875.00

(ii) අනුව කාල විශ්ලේෂණය

වසර 5 ට අඩු	සිද්ධි සංඛ්‍යාව	1
	ගණන	රු 1,112,875.00
වසර 5-10	සිද්ධි සංඛ්‍යාව	
	ගණන	රු
වසර 10 ට වැඩි	සිද්ධි සංඛ්‍යාව	
	ගණන	රු

සටහන - වැය විෂය 1701 යටතේ වර්ෂය තුළ ගිණුම්ගත කරන ලද හෝ ඉදිරි වර්ෂවලදී ගිණුම්ගත කිරීමට අපේක්ෂිත මු.රෙ. 106 යටතේ වන හානි හා මු.රෙ 113 යටතේ වන අත්හැරීම් පිළිබඳ විස්තර ඇතුළත් කළ යුතු ය.

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මූදල්) /කොමිසාරිස් (මූදල්)
දිනය :2022.02.21

M. K. D. Shiromini
Chief Accountant
State Ministry of Tanks, Reservoirs and Irrigation
Development of Rural Paddy Fields
No. 11, Jawatta Road,
Colombo 05.

16

සටහන-(ii)

පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශය

වියදම් ශීර්ෂ අංකය : 429

අමාත්‍යාංශයේ නම : ග්‍රාමීය කුඹුරු හා ආෂ්‍රිත වැව් ,ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

වැඩසටහන් අංකය හා නාමය:01- මෙහෙයුම් වැඩසටහන

1 වර්ෂය තුළ සිදුවූ මු.ගෙ.109 යටතේ වන පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය

අගය		සිද්ධි සංඛ්‍යාව	වටිනාකම (රු)
(i)	රු. 25,000.00 අඩු	0	0
(ii)	රු. 25,000.01 වැඩි	1	1,112,875.00
එකතුව		1	1,112,875.00

2 වර්ෂය තුළ මු.ගෙ. 109 යටතේ වන පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම් පිළිබඳ ප්‍රකාශය

	අලාභයේ ස්වභාවය	ආරම්භක කපා නොහළ ශේෂය රු.	අලාභයේ වටිනාකම රු.	අයකර ගැනීම් රු.	පොතෙන් කපා හළ අගය රු.	කපා නොහළ ඉදිරියට ගෙනයන ශේෂය රු.	පොතෙන් කපා හැරීම් සඳහා වූ අනුමැතියේ යොමු අංකය
1	KV -1788 දරණ රථය අනතුරට ලක්වීම	2,128,454.31	1,112,875.00	689,200.00	0	423,675.00	
2							
	එකතුව	2,128,454.31	1,112,875.00	689,200.00		423,675.00	

සටහන - සටහන (i) හි ඇතුළත් ගිණුම්ගත කළ යුතු පාඩු හා අත්හැරීම් හැර මු.ගෙ. 109 යටතේ වන අනෙකුත් පාඩු හා අත්හැරීම් පමණක් මෙම ආකෘතියේ ඇතුළත් කළ යුතු ය.

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මූදල්) /කොමසාරිස් (මූදල්)
දිනය : 2022.10.24

M. K. D. Shiromini
Chief Accountant
State Ministry of Tanks, Reservoirs and Irrigation
Development of Rural Paddy Fields
No. 11, Jawatta Road,
Colombo 05.

සටහන - (iii)

දෙසැම්බර් 31 දිනට බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම: ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව් ,ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

වියදම් ශීර්ෂ අංකය: 429

වැඩසටහන් අංකය හා නාමය: 02 සංවර්ධන කටයුතු

පුද්ගලයාගේ/ආයතනයේ නම	බැඳීම් අංකය	දිනය	ශීර්ෂය	වැඩසටහන	ව්‍යාපෘතිය	උප ව්‍යාපෘතිය	වැය විෂයය	අයිතම අංකය	මූල්‍යකරණය	බැඳීම් (රු.) (1)	බැඳීම් ශේෂය (රු.) (2)=(1)-(3)	බැරකම්වලට ඇතුළත් වූ දිනය	බැරකම් වටිනාකම (රු.) (3)	සංශෝධිත (4)	බැරකම් නිදහස් කිරීම (රු.) (5)	බැරකම් ශේෂය (රු.) (6)=(4)-(5)
ඩබ්ලිව් එම් ජේ උදයලාල්	40	31-Dec	429	2	3	2	2506		11	18,602.00	-	31-12-21	18,602.00	-	-	18,602.00
එස් එච් සී සංකල්ප	42	31-Dec	429	2	3	2	2506		11	35,312.00	-	31-12-21	35,312.00	-	-	35,312.00
ඉංජිනේරු ජී ඩී එෆ් යූ පෙරේරා	45	31-Dec	429	2	3	2	2506		11	140,620.59	-	31-12-21	140,620.59	-	-	140,620.59
ඩබ්ලිව් එම් ජේ උදයලාල්	41	31-Dec	429	2	3	2	2506		11	7,732.48	-	31-12-21	7,732.48	-	-	7,732.48
Toyota Lanka Pvt Ltd	38	31-Dec	429	2	3	2	2506		11	1,096,083.03	-	31-12-21	1,096,083.03	-	-	1,096,083.03
ඉංජිනේරු ඊ එම් ටී ජී එදිරිසූරිය	39	31-Dec	429	2	3	2	2506		11	39,000.00	-	31-12-21	39,000.00	-	-	39,000.00
එස් එච් සී සංකල්ප	43	31-Dec	429	2	3	2	2506		11	62,079.90	-	31-12-21	62,079.90	-	-	62,079.90
විශාකා වාදිහිටි සංවිදානය	12-563	31-Dec	429	2	3	2	2506		11	1,506,688.77	-	31-12-21	1,506,688.77	-	-	1,506,688.77
පුබෝධ ගොවි සංවිදානය	12-564	31-Dec	429	2	3	2	2506		11	1,266,245.21	-	31-12-21	1,266,245.21	-	-	1,266,245.21
දොළුව ගොවි සංවිධානය	12-565	31-Dec	429	2	3	2	2506		11	970,000.00	-	31-12-21	970,000.00	-	-	970,000.00
මිහිදෙව් ග්‍රාම සංවර්ධන සමිතිය	12-566	31-Dec	429	2	3	2	2506		11	785,788.03	-	31-12-21	785,788.03	-	-	785,788.03
මහසෙන් ගොවි සංවිදානය	12-567	31-Dec	429	2	3	2	2506		11	587,950.00	-	31-12-21	587,950.00	-	-	587,950.00
ගොඩවෙල ගොවි සංවිදානය	12-568	31-Dec	429	2	3	2	2506		11	403,224.20	-	31-12-21	403,224.20	-	-	403,224.20
දොළුව පුාදේශීය ලේකම් කොට්ටාශයේ ග්‍රාම සංසවර්ධන	12-569	31-Dec	429	2	3	2	2506		11	1,575,000.00	-	31-12-21	1,575,000.00	-	-	1,575,000.00
පුබෝධ ගොවි සංවිදානය	12-571	31-Dec	429	2	3	2	2506		11	970,000.00	-	31-12-21	970,000.00	-	-	970,000.00
රාජසිංහ ගොවි සංවිදානය	12-572	31-Dec	429	2	3	2	2506		11	977,760.00	-	31-12-21	977,760.00	-	-	977,760.00
සෞභාග්‍යා	22*01	31-Dec	429	2	3	2	2506		11	4,354,247.32	-	31-12-21	4,354,247.32	-	-	4,354,247.32
උඩ දෙල්තොට ගොවි සංවිදානය	12/335	31-Dec	429	2	3	2	2506		11	485,000.00	-	31-12-21	485,000.00	-	-	485,000.00
45	45	31-Dec	429	2	3	2	2506		11	970,000.00	-	31-12-21	970,000.00	-	-	970,000.00
46	46	31-Dec	429	2	3	2	2506		11	970,000.00	-	31-12-21	970,000.00	-	-	970,000.00
47	47	31-Dec	429	2	3	2	2506		11	1,590,000.00	-	31-12-21	1,590,000.00	-	-	1,590,000.00
48	48	31-Dec	429	2	3	2	2506		11	1,940,000.00	-	31-12-21	1,940,000.00	-	-	1,940,000.00
එකතුව										588,154,604.97	108,418,673.27		468,404,286.12	231,762.33	204,460,411.02	263,943,875.10
මුළු එකතුව										645,807,163.43	114,958,372.19		519,517,145.66	231,762.33	206,448,825.34	313,068,320.32

ගෙවීම්/බැඳීම්වල ස්වභාවය පහත සඳහන් ආකාරයට හඳුනාගත යුතු ය.

1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු
2. රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල
3. පෞද්ගලික අංශය

බැරකම් යනු අදාළ ගිණුම් වර්ෂය ඇතුළත භාණ්ඩ, සේවාවන් හෝ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවලට අදාළ වත්කම් හා සේවාවන් ලැබී ඇති නමුත් ගිණුම් වර්ෂය තුළදී ඒ සඳහා අදාළ පාර්ශ්වයන්ට ගෙවීම් සිදුකර නොමැති ගනුදෙනුය.

බැඳීම් යනු අදාළ ගිණුම් වර්ෂය ඇතුළත භාණ්ඩ, සේවාවන් හෝ ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් අදාළ වත්කම් හෝ සේවාව ආයතනය වෙත ලැබී නොමැති, එහෙත් එකී භාණ්ඩ හා සේවාවන් ලබාගැනීමේ අරමුණින් බාහිර පාර්ශ්වයන් සමඟ එළඹ ඇති ගිවිසුම් හෝ ලිඛිත එකඟතාවයන්ය.

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2022.02.24

M. K. D. Shiromini
Chief Accountant
State Ministry of Tanks, Reservoirs and Irrigation
Development of Rural Paddy Fields
No. 11, Jawatta Road,
Colombo 05.

බැරකම් පිළිබඳ ප්‍රකාශය - (i)

මු.රෙ.94 (2) සහ (3) ප්‍රකාරව එළඹෙන ලද බැඳීම් ප්‍රකාශය

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම: ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව් ,ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

වියදම් ශීර්ෂ අංකය: 429

වැඩසටහන් අංකය හා නාමය: 02 සංවර්ධන කටයුතු

පුද්ගලයාගේ/ආයතනයේ නම	බැඳීම් පිළිබඳ විස්තරය	ව්‍යාපෘතිය	උප ව්‍යාපෘතිය	වැය විෂය සංකේතය	ඵලදායීකරණ සංකේතය	මු.රෙ. 94(2) හි සඳහන් ප්‍රතිපාදන අනුව එළඹිය හැකි උපරිම බැඳීම සීමාව (රු.)	මු.රෙ. 94(3) අනුව ඵල පිරිවැය ඇස්තමේන්තුව (රු.)	බැඳීම් හා බැරකම් වටිනාකම (රු.)
ජේ සී ටී කන්ස්ට්‍රක්ෂන් ප්‍රයිවට් ලිමිටඩ්	SLW/08/72	3	2	2506	11			200,000.00
නිව් සමන් හාඩ්වෙයාර්	LN870	3	2	2506	11			528,400.00
ජේ සී ටී කන්ස්ට්‍රක්ෂන්	SLW/09/32	3	2	2506	11			83,612.00
ඩී අයි ටී සිලාවතුරේ කාර්ය මණ්ඩලය	SLW/08/68	3	2	2506	11			180,000.00
මුත්තරිස්සු නැගෙනහිර ගොවි සංවිධානය	SLW/08/69	3	2	2506	11			43,036.97
කොණ්ඩවිවි ගොවි සංවිධානය	SLW/08/70	3	2	2506	11			662,172.47
මහන්චෙලි ගොවි සංවිධානය	SLW/08/71	3	2	2506	11			500,000.00
උතුරු මැද පළාත තුලින කදුරු පිටිය වැව		3	2	2506	11			6,512,297.52
උතුරු මැද පළාත තුලින අලපත් කුඩා වැව		3	2	2506	11			5,333,637.82
උතුරු මැද පළාත තුලාන වන්නම්මඩුව වැව		3	2	2506	11			6,586,382.11
මුළු එකතුව								**108,357,752.50**

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමිසාරිස් (මුදල්)
දිනය : 2022-2-24

M. K. D. Shiromini
Chief Accountant
State Ministry of Tanks, Reservoirs and Irrigation
Development of Rural Paddy Fields
No. 11, Jayawardhana Road,
Colombo 05.

ඇටහන-(v)

2015/10/23 දින නිකුත් කරන ලද භාණ්ඩාගාර මෙහෙයුම් වක්‍රලේඛ අංක 2015/03 හි උපදෙස්වලට අනුකූලව ආරම්භ කරන ලද බැංකු ගිණුම් පිළිබඳ 2021.12.31 දිනට තත්ත්ව වාර්තාව

විෂයභාර ශීර්ෂ අංකය:429 අමාත්‍යාංශයේ නම: ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව් ,ප්ලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

අනු අංකය	බැංකුවේ නම	ගිණුම් අංකය	2021.12.31 දිනට බැංකු ප්‍රකාශනය අනුව ශේෂය (රු.)	2021.12.31 දිනට මුදල් පොත අනුව ශේෂය (රු.)	2021.12.31 දිනට බැංකුවට ඉදිරිපත් නොකරන ලද චෙක්පත් එකතුව (මාස 6 ට වැඩි ඇමකාත්)	අවසාන වරට බැංකු සැසඳුම් සකස් කළ මාසය
1	ලංකා බැංකුව / කොරින්ටන්	7042643	91,371,527.57	0	0	දෙසැම්බර්

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට තහවුරු කරමි.

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2022.02.25

M. K. D. Shiromini
Chief Accountant
State Ministry of Tanks, Reservoirs and Irrigation
Development of Rural Paddy Fields
No. 11

3.6. ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

රු. ,000

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2002-01-01	ගෙවල් කුලී	2021 සඳහා ඇස්තමේන්තු කර නොමැත		384	අදාල නොවේ
2002-02-99	ණය පොළි			195.6	
2003-99-00	වෙනත් රජයේ ආදායම			26	
2004-01-00	වැ.අ.ද.			1311	
2006-02-01	වාහන පාවිච්චිය			0	

3.7. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
පුනරාවර්තන	99,000	96,000	76,229.166	79.41%
ප්‍රාග්ධන	3,015,000	3,018,000	2,581,003.69	85.52%

3.8. මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. 000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණු	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
01.	වාරිමාර්ග අමාත්‍යාංශය	අමාත්‍යාංශයට වැසිකිලි පද්ධතියක් සකස් කිරීම	2,800	2,800	413.165	14.75%

3.9. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. 000

වත්කම් කේතය	කේත විස්තරය	**2021.12.31** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**2021.12.31** දිනය මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	2,571.665	22,571.665	නොමැත	අදාල නොවේ
9152	යන්ත්‍රෝපකරණ	41,961.012	41,961.012		
9153	ඉඩම්	-	-		
9154	අස්පෘශ්‍ය වත්කම්	311.444	311.444		
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-		
9160	කෙරීගෙන යන වැඩ	-	-		
9180	බදු දෙන ලද වත්කම්	-	-		

3.10. විගණකාධිපතිවරයාගේ වාර්තාව

ඇමුණුම 1 ලෙස අමුණා ඇත.

04 පරිච්ඡේදය - කාර්යයසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යයසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතය (%) ලෙස නිත්‍ය නිමැවුමක් ලෙස			
	100%-90%	**75%/89%**	**50%-74%**	**5%-49%**
2021-2023 මධ්‍යකාලීන අයවැය රාමුව තුල පුනරුත්ථාපනය/ප්‍රතිසංස්කරණය/නවීකරණය කිරීමට යෝජිත වැව්/අමුණු 5000 ක සංඛ්‍යාවකින් 1000 ක් පුනරුත්ථාපනය/ප්‍රතිසංස්කරණය/නවීකරණය කිරීම	√			
පුනරුත්ථාපනය කරන ලද වැව් මැණුම් කටයුතු කර නිරවුල් කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම -මූලික සැලසුම් කටයුතු නිම කිරීම	√			
ග්‍රාමීය වාරි පද්ධති පිලිබඳ භූගෝලීය තොරතුරු පද්ධතියක් ස්ථාපනය කිරීම				√

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න

ඉලක්කය/අරමුණ	ඉලක්ක	ජයග්‍රහන දර්ශක	මේ දක්වා ජයගහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
1.සියළු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම	1.2 ජාතික මට්ටමේ අර්ථ නිරූපණවලට අනුකූලවන පරිදි සියළුම ආකාරයේ දරිද්‍රතාවයෙන් පෙලෙන සියළුම වයස් කාණ්ඩ වලට අයත් පිරිමින්, කාන්තාවන් හා ළමුන්ගේ අනුපාතය අවම වශයෙන් අඩකින් අඩු කිරීම.	1.2.1 ස්ත්‍රී පුරුෂ භාවය සහ වයස අනුව ජාතික දරිද්‍රතා රේඛාවෙන් පහල ජීවත්වන ජනගහනයේ අනුපාතය.	√		
		1.2.2. ජාතික අර්ථ දැක්වීම් වලට අනුව දරිද්‍රතාවයේ සියළු මානයන්ට අදාල තත්ත්වය තුල ජීවත්වන සියළු වයස් කාණ්ඩයන්ට අයත් පුරුෂ ස්ත්‍රී හා ළමා ජනගහනයේ ප්‍රමාණය	√		
	1.5 2030 වන විට දරිද්‍රතාවයෙන් පෙළෙන්නන්ගේ සහ අවදානමට ලක්විය හැකි තත්ත්වයේ සිටින්නන්ගේ ඔරොත්තුදීමේ හැකියාව වර්ධනය කිරීම සහ ඔවුන් කාළගුණික තත්ත්වයන්ගෙන් ඇති වන්නාවූ හානිකර බලපෑම්ද ආර්ථික සමාජ සහ පරිසරමය වශයෙන් ඇතිවන්නාවූ හානි සහ ආපදා වලට නිරාවරණයවීමද අඩු කිරීම.	1.5.2 ලෝක දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව ස්වභාවික ආපදා හේතුවෙන් සිදුවන සෘජු ආර්ථික හානිය.	√		

2. සාගින්න නැතිකර ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්ත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම	2.3 2030 වන විට කුඩා පරිමාණ ආහාර නිෂ්පාදකයන්ගේ, විශේෂයෙන්ම කාන්තාවන්ගේ, ස්වදේශික ජනයාගේ, ගොවි පවුල් සහ ධීවරයන්ගේ කෘෂිකාර්මික ඵලදායිතාවය සහ ආදායම, ඉඩම්වලට ආරක්ෂාකාරීව සහ සාමාන්‍ය ලෙස ප්‍රවේශවීමේ අවස්ථාවන්, අනෙකුත් නිෂ්පාදන සම්පත් හා ප්‍රදානයන්, දැනුම, මූල්‍ය සේවා, වෙළඳපල සහ වටිනාකම් එකතු කිරීම් හා ගොවිපළ නොවන රැකියා සඳහා අවස්ථාවන් ලබාදීම මඟින් දෙගුණ කිරීම.	2.3.1 ගොවි/ගව පාලන/වනාන්තර ආශ්‍රිත කර්මාන්තයන් පන්තීන්හි විශාලත්වය අනුව ශ්‍රම ඒකකයක් සඳහා නිෂ්පාදන පරිමාව	√		
	2.4 2030 වන විට ආහාර නිෂ්පාදන පද්ධති පැවතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පැවතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පවත්වා ගැනීමට උපකාරී වන්නාවූ කාලගුණ වෙනස්වීම් වලට හැඩගැසීම සඳහා වූ ධාරිතාවන් ශක්තිමත් කරන්නාවූ හානිකර කාලගුණ තත්ත්වයන්, නියඟ, ගංවතුර සහ වෙනත් ආපදාවන් සහ ඉඩම් සහ පසේ ගුණාත්මක තත්ත්වයන් වර්ධනය කරන්නාවූ ඔරොත්තු දිය හැකි කෘෂිකාර්මික භාවිතාවන් ක්‍රියාවට නැංවීම.	2.4.1 ඵලදායී සහ තිරසාර කෘෂිකර්මය සිදු කරන කෘෂිකාර්මික බිම් ප්‍රමාණය.	√		
15. භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමණාකරණය, කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියාකිරීම ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම, ඉඩම් හායනය නැවැත්වීම සහ පුනරුත්ථාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම.	15.1 2020 වන විට භූමියේ සහ ගොඩබිම අභ්‍යන්තරයේ පවත්නා මිරිදිය පරිසර පද්ධති සහ ඒවායින් ලැබෙන්නාවූ සේවාවන්, විශේෂ වනාන්තර, කඳු සහ වියළි බිම් අන්තර් ජාතික ගිවිසුම් වලට අනුකූල වන පරිදි සංරක්ෂණය, නැවත නගාසිටුවීම සහ තිරසර අන්දමින් භාවිතා කිරීම තහවුරු කිරීම	15.1.2 ආරක්ෂිත ප්‍රදේශ හා පරිසර පද්ධති ආකාරය අනුව භෞතික හා මිරිදිය ජෛව විවිධත්වය සඳහා වන වැදගත් ස්ථාන ප්‍රමාණය	√		

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න

දිවයින පුරා පිහිටි තෝරාගත් සුළු වාරිමාර්ග වැව් /අමුණු හා ඇල මාර්ග පුනරුත්ථාපනය/ප්‍රතිසංස්කරණය හා නවීකරණය කිරීම මඟින් වැව් වල ජල ධාරිතාවය නිසි පරිදි පවත්වා ගැනීම ඉහල නැංවීම මගින් ප්‍රතිලාභී ගොවි පවුල් සඳහා වාරි ජල සැපයුම සහතික කිරීමත් එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා එම ගොවි ජනතාවට අවස්ථාව ලබා දීම ත් මඟින් ගොවි ජනතාවගේ ආදායම් තත්ත්වය හා ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නංවා එම පවුල් ආශ්‍රිත සියළු වයස් කාණ්ඩ වල ස්ත්‍රී , පුරුෂ හා ළමා කොටස් හි දරිද්‍රතාවය අඩු කිරීමට කටයුතු සලසා ඇත.එමෙන්ම මෙම ප්‍රතිසංස්කරණයන් සමඟ එම ප්‍රතිලාභී ජනතාව කාළගුණික තත්ත්වයන්ගෙන් ඇති වන්නාවූ හානිකර බලපෑම් ද ආර්ථික සමාජීය හා පාරිසරික වශයෙන් ඇතිවන්නාවූ හානි තුලින් ආපදා වලට නිරාවරණය වීම ද තුලින් ස්වභාවික ආපදා හේතුවෙන් සිදුවන සෘජු ආර්ථික හානිය අවම කිරීමට කටයුතු කර ඇත.

දිවයින පුරා පිහිටි පුනරුත්ථාපනය කරන ලද තෝරා ගත් සුළු වාරිමාර්ග වැව් වල වැව් තාවුළු හා රක්ෂිත මැණුම් කර නිරවුල් කිරීම සඳහා 2021 වර්ෂයේදී මූලික කටයුතු සිදු කර ඇත. රක්ෂිත සීමා නිර්ණය මඟින් නීතිමය රාමුව සවිමත් කොට අනවසර ඉදිකිරීම් හා ආක්‍රමණයන් වලක්වා කාළගුණික තත්ත්වයන්ගෙන් ඇති වන්නාවූ හානිකර බලපෑම්ද ආර්ථික සමාජ සහ පරිසරමය වශයෙන් ඇතිවන්නාවූ හානි සහ ආපදා වලට නිරාවරණය වීම තවදුරටත් වලක්වා ලීමට කටයුතු සලසා ඇත.

භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමණාකරණය, කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියාකිරීම ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම, ඉඩම් හායනය නැවැත්වීම සහ පුනරුත්ථාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම යන කාරණා වලට අනුගත වන පරිදි තෝරා ගත් එල්ලංගා පද්ධති සංවර්ධනයට පියවර ගැනීම මඟින් පරිසර පද්ධතිය වැඩිදියුණු කිරීම හා ඒ ආශ්‍රිත ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම, හා වැඩිදියුණු කිරීමට මුල පුරා ඇත.

තෝරාගත් සුළු වාරිමාර්ග වැව් වල භූමි හා ජල ඵලදායීතාවය වැඩි කිරීම හා ඒ ආශ්‍රිත පරිසර පද්ධති වැඩිදියුණු කිරීම වැව් ආශ්‍රිත වන වගාව හා රුක් රෝපණ වැඩසටහන්, ක්‍රියාත්මක කරමින් භූගෝලීය පරිසර පද්ධතීන් තිරසර භාවිතයට ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී.එම තෝරාගත් වැව් සඳහා මිරිදිය මත්ස්‍ය වගාවට ඉඩ ප්‍රස්ථා ඇති කිරීම තුලින් මිරිදිය පරිසර පද්ධති ආශ්‍රිත ජෛව විවිධත්ව විකාශනයන් සඳහා මඟ පාදා ඇත.එලෙසම ඒ ඔස්සේ ගොවි පවුල් සහ ධීවරයන්ගේ ශ්‍රම ඒකකයක් සඳහා නිෂ්පාදන පරිමාව වැඩි කර කෘෂිකාර්මික ඵලදායීතාවය සහ ආදායම තව දුරටත් ඉහළ නැංවීම හා ගොවිපළ නොවන රැකියා සඳහා අවස්ථාවන් ලබාදීමට කටයුතු කර ඇත.

අභියෝග

අරමුණු හා ඉලක්ක වෙත සැලසුම් කර ඇති පරිදි ලභා වීම සඳහා ඒ ඒ වැඩසටහන් සඳහා වාර්ෂික ව වෙන් කෙරෙන ප්‍රතිපාදනයන් සීමිත වීම , පුද්ගල ආකල්ප වෙනස් කිරීම සඳහා ඔවුන් නිරන්තර දැනුවත් කිරීමේ වැඩසටහන් රාජ්‍ය අනුග්‍රහයෙන් සිදුකළ යුතු වීම මේ සඳහා ඇති ප්‍රධාන අභියෝග ලෙස දැක්විය හැකිය.

0.6 පරිච්ඡේදය- මානව සම්පත් පැතිකඩ

06.1 සේවක සංඛ්‍යා කළමණාකරනය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබැර්තු/(අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	22	13	09
තෘතීයික	03	-	03
ද්විතියක	25	16	09
ප්‍රාථමික	20	11	09

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න

ආයතනයේ පාලන හා සංවර්ධන කාර්යයන් සඳහා අත්‍යවශ්‍ය මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරු ඉහත වගුවේ දක්වා ඇති ආකාරයට පුරප්පාඩුව පැවතීම මානව සම්පත තුලින් අධීක්ෂණය මෙහෙයවීම ඉලක්ක ගත අරමුණු කරා යාමට නොහැකි වීම.

6.3 මානව සම්පත් සංවර්ධනය

* ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේ ද යන්න කෙටියෙන්

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (RS.000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ලබා ගත් දැනුම*
			දේශීය	විදේශීය		
ප්‍රසම්පාදනය පිලිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	01	දින 09	20,000.00		දේශීය	ප්‍රසම්පාදනය පිලිබඳ දැනුම
රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් පරිවර්තන පිලිබඳ එක්දින පුහුණු වැඩමුළුව	01	දින 01	40,000.00		දේශීය	වැටුප් සකස්කිරීමේ ක්‍රියාවලිය පිලිබඳ දැනුම
රාජ්‍ය ආයතනවල කළමනාකරණය පිලිබඳ වැඩමුළුව	01	දින 01	8,000.00		දේශීය	රාජ්‍ය ආයතන කළමනාකරණය පිලිබඳ දැනුම
පෞද්ගලික ලිපිගොනු කළමනාකරණය	01	දින 01	3,800.00		දේශීය	පෞද්ගලික ලිපිගොනු කළමනාකරණය පිලිබඳ දැනුම
කාර්යාල කළමනාකරණය පිලිබඳ වැඩමුළුව	01	දින 01	8,000.00		දේශීය	කාර්යාල කළමනාකරණය පිලිබඳ දැනුම
ඵලදායි තීරණ සඳහා උපකාරක මෙවළමක් ලෙස භූගෝලීය තොරතුරු පද්ධතිය භාවිතය	05	දින 07	47,000.00		දේශීය	ඉංජිනේරුමය දැනුම වර්ධනය
රජයේ වාහන නඩත්තුව	01	දින 01	5,000.00		දේශීය	වාහන නඩත්තුව පිලිබඳ දැනුම

පැහැදිලි කරන්න

07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
01	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකා රම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාල නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අදාල නොවේ		
1.6	වෙනත්	අදාල නොවේ		
02	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙළ කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20)යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම			
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
05	**විගණන විමසුම්**	අනුකූල වේ		
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව,	අනුකූල නොවේ	වර්ෂය ආරම්භයේදී කැබිනට් අමාත්‍යාංශ	විගණක අංශයක් ස්ථාපිත කිරීම හා අදාල කාර්යයන් ඉටු කිරීම

	අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම		අභ්‍යන්තර විගණන සැලැස්මට ඇතුලත් කිරීම සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණක වෙත දන්වා ඇත.	
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණක ඇතුළු කාර්ය මණ්ඩල පුරප්පාඩු ව පැවතීම නිසා අභ්‍යන්තර විගණක අංශයක් ස්ථාපිත ව නොපැවතිණි.	විගණක අංශයක් ස්ථාපිත කිරීම හා අදාල කාර්යයන් ඉටු කිරීම
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණක වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල නොවේ	කැබිනට් අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටුවට සහභාගි වීම	විගණක අංශයක් ස්ථාපිත කිරීම හා අදාල කාර්යයන් ඉටු කිරීම
8	**වත්කම් කළමනාකරණ කමිටු**	අනුකූල වේ		
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල නොවේ	වාහන ගර්හිත වී නැත.	
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල නොවේ	ගෙවීම් අවසන් වී නොමැති වීම	ගෙවීම් අවසන් වූ පසු පවරා ගැනීම
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			

10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		

14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳව තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම			

18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල නොවේ	පුරවැසි ප්‍රඥාප්තිය සකසමින් පවතී	
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	පුරවැසි ප්‍රඥාප්තිය සකසමින් පවතී	
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**	අනුකූල වේ		
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. IWR/A/SMID/FA/2021/29 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2022 මැයි 25 දින

ගණන්දීමේ නිලධාරී,
ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය.

ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කල මතය

ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම්

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම්, විගණකගේ වගකීම් යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම් වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කාල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම ඇගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූලධන වියදම්

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් ස්ථාවර වත්කම් ගිණුම්ගත කිරීම සම්බන්ධව ලබාදී ඇති උපදෙස් අනුව සංකේත අංක 61414 යටතේ වැව් ජලාශ ඇලවේලි ආදී මූල්‍ය නොවන වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වුවත් 2021 වර්ෂය තුල රු.2,568,196,192 ක් වැයකර සංවර්ධනය කරන ලද දේපල නිෂ්චිත ලෙස හඳුනාගෙන මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. එම වියදම් වලින් රු.375,949,842 පමණක් අමාත්‍යාංශය විසින් සෘජුව වැයකර තිබූ අතර ඉතිරිය වෙනත් දෙපාර්තමේන්තු වෙත නිදහස් කළ ප්‍රතිපදන යටතේ වැයකර ගිණුම්ගත කර තිබුණි. එකී ප්‍රතිපදන නිදහස් කිරීමේදී එය යටතේ ගොඩනගන වත්කම් එකී ආයතනයන්හි මූල්‍ය නොවන වත්කම් ලෙස හඳුනාගත යුතු බවට උපදෙස් ලබාදී නොතිබුණි. ඒ අනුව එම සම්පූර්ණ වත්කම් අමාත්‍යාංශ ගිණුම් මගින් අනාවරණය කල යුතුව පැවතුණි.

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව 2021 වර්ෂය වෙනුවෙන් මූලධන වියදම් ලෙස දරා තිබූ රු.2,568,196,192 දේපල පිරියත හා උපකරණ ලෙස ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය ශුද්ධ වත්කම්/ස්කන්ධය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. එම වියදම් අමාත්‍යාංශයේ සමස්ත වියදම්වල සියයට 96.6 ක් වී තිබුණි.

1.6.2 දේපළ පිරියත හා උපකරණ

සමාලෝචිත වර්ෂය අවසානය වනවිට රාජ්‍ය අමාත්‍යාංශයට අයිති පිරිවැය රු.62,490,000 වාහන 4 ක් තිබුණි. ඉන් රු.27,990,000 ක් වූ වාහන පිළිබඳ තොරතුරු මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ ඇතුලත් කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 අග්‍රිම කළමනාකරණය

සමාලෝචිත වර්ෂය තුළ රාජ්‍ය අමාත්‍යාංශය විසින් ඉටුකිරීමට සැලැසුම් කරන ලද කාර්යයන් සඳහා රු.743,413,000 ක අග්‍රිම මුදලක් ඉල්ලුම් කර තිබුණ ද මහා භාණ්ඩාගාරය රු.463,011,000 ක් නිදහස් කර තිබුණි. ඒ අනුව ඉල්ලුම් කරන ලද අග්‍රිමයෙන් සියයට 37.7 ක් ලැබී නොතිබුණි.

2.2 බැරකම් හා බැදීම්

(අ) මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තුවල ප්‍රතිපාදන ඇත්නම් පමණක් දෙපාර්තමේන්තුවක් විසින් වැඩක් හෝ සේවාවක් හෝ සැපයුමක් සඳහා කිසියම් වියදමකට හෝ බැදීමකට හෝ එළඹිය හැකි වුවද සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වෙනත් මූලධන වියදම් අනුමත ප්‍රතිපාදන ඉක්මවා රු.62,127,413 ක බැරකම් ඇතිකරගෙන තිබුණි.

(ආ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ 255/2017 ප්‍රකාරව 2021 දෙසැම්බර් 31 දිනට බැදීම් හා බැරකම් ප්‍රමාණය රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නඩත්තු කරන ලද තොරතුරු පද්ධතියට දිනපතා යාවත්කාලීන කිරීම සඳහා සෑම වියදම් ඒකකයක්ම සම්බන්ධයෙන් ඇති කරගන්නා බැදීම් බැරකම් හා එම බැරකම් නිදහස් කිරීම පිළිබඳව තොරතුරු වෙබ් අඩවියට උඩුගත (UP LORD) කළ යුතු බවට උපදෙස් ලබාදී තිබුණි. 2021 වර්ෂයට අදාලව සිගාස් වැඩසටහනට ඇතුලත්කර තිබූ දත්ත සහ මූල්‍ය ප්‍රකාශනවල සටහන (iii) බැදීම් හා බැරකම් ප්‍රකාශය ඇතුලත් වටිනාකම් අතර වෙනස්කම් නිරීක්ෂණය විය.

2.3 වියදම් කළමනාකරණය

ඇස්තමේන්තු සකස්කිරීමේ දී අවශ්‍යතා හඳුනාගැනීමකින් තොරව වෙන්කිරීම් සිදු කිරීම සහ සැලැසුම් කරන ලද පරිදි වැඩ කටයුතු සිදු නොකිරීම හේතුවෙන් වැය විෂයයන් 15 ක් සඳහා වෙන්කර තිබුණු එකතුව රු.81,283,000 ක් වූ ශුද්ධ වෙන්කිරීම් වලින් එකතුව රු.23,547,689 ක් හෙවත් සියයට 39 ක් ඉතිරි වී තිබුණි. එක් එක් වැය විෂය යටතේ වූ ඉතිරිය සියයට 20 ත් සියයට 92 ත් අතර පරාසයක් ගෙන තිබුණි.

2.4 නීතිරීති රෙගුලාසිවලට අනුකූල නොවීම

නීතිරීති රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 146	වෙනත් ගණන්දීමේ නිලධාරීන් වෙත ස්වකීය වැය ශීර්ෂය යටතේ වියදම් දැරීම සඳහා නිදහස් කරනු ලබන ප්‍රතිපාදන යටතේ ඉටුකරනු ලබන වැඩෙහි සැලැස්ම, ප්‍රගතිය, වියදම් සහ ඉතිරිය පිළිබඳ විමසිලිමත් විය යුතු අතර වැඩ සැලැස්මෙන් බැහැර නොවන බව හා සීමාවන් නොයික්ම වන බව තහවුරු කර ගැනීමට කටයුතු කළයුතු වුවත් වියදම් විෂය අංක 2506 යටතේ වෙනත් ගණන්දීමේ නිලධාරීන් වෙත නිදහස්කල ප්‍රතිපාදන සම්බන්ධයෙන් උක්ත විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ දුර්වලතා

වාරි සෞභාග්‍යා වැඩසටහන යටතේ 2021-2023 මධ්‍යකාලීන අයවැය රාමුව තුල වැව්/අමුණු හා ආශ්‍රිත ඇලමාර්ග 5000 ක් සකස් කිරීමට පැවරී තිබුණි. ඒ යටතේ 2021 වර්ෂය තුල රු.2,568,196,192 වැයකර දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන පරිදි වැව්/අමුණු 1400 ක් පමණක් ප්‍රතිසංස්කරණය කර තිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය හා නත්‍ය කාර්ය මණ්ඩලය

සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය 70 ක් වූ අතර නත්‍ය කාර්ය මණ්ඩලය 37 ක් විය. ඒ අනුව පුරප්පාඩු සංඛ්‍යාව 33 ක් විය.

විස්තරය	අනුමත සේවක සංඛ්‍යාව	නත්‍ය සේවක සංඛ්‍යාව	ඌනතාවය
ජ්‍යෙෂ්ඨ	21	12	09
තෘතීයික	04	01	03
ද්විතියික	25	13	12
ප්‍රාථමික	20	11	09
එකතුව	70	37	33

(අ) ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 09 ක, තෘතියික මට්ටමේ තනතුරු 03 ක, ද්විතියික මට්ටමේ තනතුරු 12 ක සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 09 ක පුරප්පාඩු පැවතියද එම තනතුරුවලට බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

ඩී.වී. චන්ද්‍රලතා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට